# ජාතික ආදායම හා වියදම

## සමස්ත උපනතීන්

1982 ස්ථාවර සාධක වියදම් මිළ අනුව, 1991 වසර තුළ, ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය, සියයට 4.8 කින් වැඩි වී ඇත. මෙය සියයට 6.2 ක් වූ පසුගිය වසරේ සිත් ඇදගන්නා සුළු වර්ධනයට වඩා අඩු වුවද, 1989 සිට ක්‍රියාත්මක කරන්නට යෙදුන ආර්ථිකය වැඩි දුරටත් ලිහිල් කිරීම ඇතුළු අනෙකුත් ප්‍රතිපත්ති ප්‍රතිශෝධනයන්ගේ හේතුවෙන් පැන නැගුණු වර්ධන ආවේගයන් තවදුරටත් අඛන්ඩව පවත්වා ගැනීම විදහා දක්වන්නකි. දළ දේශීය නිෂ්පාදිතයේ සහ විදේශීය ශුද්ධ සාධක ආදායමේ එකතුව වන දළ ජාතික නිෂ්පාදිතය මූර්ත වශයෙන් සියයට 4.7 ක වර්ධනයක් වාර්තා කළ අතර, 1990 වසරේ වාර්තා වූ වර්ධනය සියයට 6.4 ක් විය. මෙම අඛන්ඩ වර්ධන ක්‍රියාකාරිත්වය, 1990 දක්වා වූ ඉකුත් පස්වසර තුළ මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ සාමාන්‍ය වර්ධනය වූ සියයට 3.5 හා සැසඳීමේදී මැනවින් කැපී පෙනෙන්නකි.

දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට වූ ආංශික දායකත්වය විශ්ලේෂණයේ දී, 1991 ආර්ථික වර්ධනය ප්‍රධාන වශයෙන් නිමැවුම් කර්මාන්ත හා සේවා යන අංශයන් වටා සංකේන්ද්‍ර වී ඇති බව පෙනෙයි. මෑත අතීතය තුළ පැවති යහපත් වර්ධන උපනතියට අනුරූපව, නිමැවුම් කර්මාන්ත අංශය 1991 තුළදී සිය උද්‍යෝගිමත් භාවය පවත්වා ගැනීමට සමත් විය. මෙම අංශයේ ප්‍රසාරණය, 1991 සමස්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයෙන් සියයට 25 ක් සඳහාම දායක විය. 1990 වසරේ වර්ධනයට මෙම අංශයෙන් වූ දායකත්වය සියයට 26 කි. මෙම දර්ශක, මෑත වසර කිහිපය තුළ ආර්ථික වර්ධනය දිරිමත් කිරීම සඳහා නිමවුම් කර්මාන්ත අංශයේ වැදගත්කම පිළිබිඹු කරයි. අපනයනය පදනම්ව රෙදි හා ඇඟලුම් කර්මාන්තයන් මුල් කරගත්, නිෂ්පාදන කර්මාන්ත අංශය නිමැවුම් කර්මාන්ත අංශයේ මුළු නිෂ්පාදනයෙන් තුනෙන් දෙකකට ආසන්න දයකත්වයක් සපයන අතර, එම අංශයේ එකතු කළ අගය මූර්ත වශයෙන් සියයට 9.5 කින් වර්ධනය විය.

1990 වසරේදී සියයට 4.3 ක වර්ධනයක් පෙන්නුම් කළ සේවා අංශය, 1991 දී සියයට 6.1 ක ඉහළ වර්ධනයක් වාර්තා කළේය. මෙම අංශය තුළ බැංකු, රක්ෂණ හා අනෙකුත් මූල්‍යමය සේවා, වෙළඳ, ප්‍රවාහන හා පණිවුඩ හුවමාරු යන අංශයන්හි ද ඉහළ වර්ධන අනුපාතයන් වාර්තා වුණි. විමසා බලනු ලබන වර්ෂය තුළ වූ සමස්ත දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයෙන් සියයට 65.4 ක්ම සංයුක්ත වූයේ සේවා අංශයේ වර්ධනයෙනි.

1990 වර්ෂය හා සැසඳීමේදී, 1991 වර්ෂයේදී ආර්ථික වර්ධන අනුපාතිකයේ මධ්‍යස්ථ තාවයට ප්‍රධාන හේතුව වූයේ කෘෂිකාර්මික අංශයෙහි දක්නට ලැබුණ ඌණ ප්‍රගතියයි. 1990 වසරේදී කෘෂිකාර්මික අංශය සියයට 8.5 ක සිත් ඇද ගන්නා සුළු වර්ධනයක් ලැබුව ද 1991 දී එම අංශය වර්ධනය වූයේ සියයට 2.9 ක තරම් ප්‍රමාණයකිනි. තවද, පතල් හා කැනීම් අංශයෙහි වූ පසුබෑම මෙන්ම, රාජ්‍ය ඉදිකිරීම් කටයුතුවල වූ මන්දගාමී වර්ධනය ද 1991 වසරේ ආර්ථික වර්ධන අනුපාතය අඩු වීමට හේතු වූ අනෙකුත් සාධක අතර වෙයි. එමෙන්ම, 1990 දී අත්පත් කරගත් ආර්ථික ප්‍රගතිය, ඉතා අඩු ආර්ථික ක්‍රියාකාරීත්වයක් හා ධාරිතා උපයෝජනයක් පෙන්නුම් කළ 1989 වර්ෂයට සාපේක්ෂව ලබා ගත්තකි. 1989 යනු, රට පුරා ව්‍යාප්ත වූ සිවිල් කලබල සහ වැඩ නැවැත්වීම් හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරිත්වය අඩාල වූ වර්ෂයක් බැවින් 1990 හා 1991 වසරවල ආර්ථිකයේ සාපේක්ෂ ප්‍රගතිය සංසන්දනයේදී මෙම සාධකද සැලකිල්ලට ගත යුතු වෙයි.

1991 දී පවත්නා සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය රුපියල් බිලියන 332 ක් ලෙස ගණන් බලා ඇති අතර, මෙය කලින් වසර හා සංසන්දනයේදී සියයට 16.9 ක වර්ධනයකි.

ආර්ථිකයේ සමස්ත මිළ වෙනස්වීම මැනීම සඳහා දර්ශකයක් වශයෙන් භාවිතා කරනු ලබන දළ ජාතික නිෂ්පාදිත අවධමනකය 1991 දී සියයට 11.6 කින් ඉහළ නැග ඇති අතර 1990 දී එහි වැඩිවීම සියයට 20 කි. මෙය 1991 වසර තුළ මිළ වැඩිවීමේ වේගය සැලකිය යුතු ලෙස අඩු වී ඇති බව පෙන්නුම් කරයි. මේ අනුව, 1982 ස්ථාවර සාධක වියදම් මිළ අනුව, 1991 සඳහා ඇස්තමේන්තු ගත දළ ජාතික නිෂ්පාදිතය රුපියල් බිලියන 132 කි.

තාවකාලික ඇස්තමේන්තුවලට අනුව 1991 වසරේදී ශ්‍රී ලංකාවේ මධ්‍ය වාර්ෂික ජනගහනය මිලියන 17.25 කි. මෙය 1990 වසරට වඩා සියයට 1.5 ක වැඩිවීමකි. මේ අනුව 1991 සඳහා ඇස්තමේන්තු කරන ලද පවත්නා මිළ ගණන් අනුව ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය රුපියල් 19,235 (ඇ.එ.ජ. ඩොලර් 465) ක් වේ. මෙය පසුගිය වසරට වඩා සියයට 15.2 ක වර්ධනයකි. මූර්ත ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය සියයට 3.2 ක් වේ.

මූර්ත ජාතික ආදායමේ වර්ධනය ඇස්තමේන්තු කිරීමේදී වෙළෙඳ අනුපාතයේ වූ වෙනස් වීම් සළකා බැලේ. වෙළෙඳ අනුපාතය, රටෙහි අපනයන මගින් ලද හැකි ආනයන ධාරිතාවයට සහ එමගින් රටෙහි මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ ජාත්‍යන්තර ක්‍රය ශක්තියට බලපායි. 1991 දී වෙළඳ අනුපාතය සියයට 1.9 කින් ආන්තිකව පහත වැටී ඇත. ඒ අනුව, මූර්ත ජාතික ආදායම, එනම් අපනයන ඉපැයීම් මත වෙළෙඳ අනුපාතයේ බලපෑමට ගලපන ලද මූර්ත දළ ජාතික නිෂ්පාදිතය, සියයට 3.9 ක වර්ධනයක් වාර්තා කරයි. මෙය මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට වඩා අඩු අනුපාතයකි. කෙසේ වුවද, මේ මූර්ත ආදායම් වර්ධනය (සියයට 3) පසුගිය වසරේ වූ වර්ධනයට වඩා වැඩි ප්‍රගතියකි.

වියදම් අංශයෙන් බැලූ විට පවත්නා වෙළෙඳ මිළ අනුව දළ දේශීය වියදම රුපියල් බිලියන 414 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 1990 වසර හා සැසඳීමේදී සියයට 19.2 ක වර්ධනයකි. 1991 දී රුපියල් බිලියන 86 ක් ලෙස ඇස්තමේන්තු ගත දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 1990 ට වඩා සියයට 20.9 කින් ඉහළ ගිය අතර පරිභෝජන වියදමේ නාමික අගය සියයට 18.7 කින් ඉහළ නැග ඇත.

මුළු ආදායම අඛණ්ඩව ඉහළ යාමත් සමගම, 1991 දී දේශීය ඉල්ලුම තවදුරටත් ශක්තිමත් වී ඇත. සියයට 2.7 ක් වූ 1990 වසරේ වැඩිවීම හා සංසන්දනයේදී 1991 දී පෞද්ගලික පරිභෝජන වියදමේ මූර්ත වටිනාකම සියයට 4.9 කින් වැඩි විය. මේ අතරම, රජයේ පරිභෝජන වියදමෙහි ද සියයට 7.3 ක මූර්ත වැඩිවීමක් වාර්තා කෙරුණි. 1991 දී සමස්ත පරිභෝජන වියදමෙහි මූර්ත වර්ධනය සියයට 5.2 කි.

1991 දී ආයෝජනය, වෙළෙඳ මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස සියයට 23 කි. මෙය සියයට 22.2 ක් වූ 1990 පැවති අනුපාතයට වඩා ප්‍රගතියකි. ඉකුත් වසරේ ලද සියයට 1.6 ක් වූ වර්ධනයට එරෙහිව1991 දී මූර්ත ආයෝජනයෙහි සියයට 12.9 ක වැඩිවීමක් වාර්තා කෙරිණි. පුද්ගලික අංශය ආයෝජනයේ ප්‍රමුඛ කාර්යභාරය වර්ධනය කළ අතර, රාජ්‍ය අංශයෙහි ආයෝජනය ප්‍රධාන වශයෙන් ආර්ථික හා සමාජීය පොදු කාර්ය පහසුකම් වර්ධනයට අවශ්‍ය ප්‍රමුඛ අංශ වෙත යෙදවින. 1991 දී පුද්ගලික අංශයෙහි ආයෝජනයන් වැඩි වශයෙන් දක්නට ලැබුනේ, නිමැවුම් කර්මාන්ත, ප්‍රවාහන හා පණිවුඩ හුවමාරු යන ක්ෂේත්‍රයන්හිය.

1991 වසර සඳහා රුපියල් බිලියන 48 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇති දේශීය ඉතුරුම්, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1990 දී වූ සියයට 14.3 සිට 12.8 දක්වා පහළ බැස ඇත. මේ අතර 1990 දී සියයට 16.8 ක් වූ ජාතික ඉතුරුම් අනුපාතිකය ද 1991 දී සියයට 15.2 ක් දක්වා අඩු වී ඇත.

## ආංශික ක්‍රියාකාරීත්වය

දළ ජාතික නිෂ්පාදිතයේ ආංශික ක්‍රියාකාරීත්වය හා 1982 ස්ථාවර සාධක මිළ අනුව එකතු කළ අගයන්හි වෙනස්වීම් 1.6 සංඛ්‍යා සටහනෙහි දැක්වේ. 1991 වසරේදී ආර්ථිකයේ ප්‍රධාන වර්ධන අංශයන් වූයේ නිමැවුම් කර්මාන්ත හා සේවා අංශයන්ය. කෘෂිකාර්මික හා පතල් කැනීම් අංශයන්හි ක්‍රියාකාරීත්වය සාපේක්ෂ වශයෙන් පහත් මට්ටමක විය.

වන සහ ධීවර අංශය ද ඇතුළත් කෘෂිකාර්මික අංශයේ වර්ධනය 1991 වසරේ සියයට 2.9 ක් වූ අතර ඉකුත් වසරේ එම අංශය සියයට 8.5 ක වර්ධනයක් ලැබීය. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය තුළ කෘෂිකාර්මික අංශයේ ඉහළ සාපේක්ෂ වටිනාකම සැළකිල්ලට ගැනීමේදී, මෙම වැදගත් අංශයෙහි අඩු වර්ධන අනුපාතය 1991 වසරේ සමස්ත ආර්ථික ක්‍රියාකාරීත්වයට අයහපත් ලෙස බලපෑවේය. වැවිලි කර්මාන්ත අංශයෙහි එකතු අගය සියයට 5.7 කින් පහත වැටී ඇත. මෙම අංශය තුළ තේ උප අංශයේ වර්ධනය සියයට 3.2 ක් වූ අතර, රබර් හා පොල් උප අංශයන් පිළිවෙලින් සියයට 8.8 කින් හා 13.3 කින් පහත වැටුණි. 1991 වසරේදී වී නිෂ්පාදනයද සුළු වශයෙන් පහත බැස ඇත. ප්‍රධාන වශයෙන් සුළු ආහාර බෝග, සුළු අපනයන බෝග, කුකුල් හා සත්ව පාලන, උක් හා දුම්කොළ වගාව ද ඇතුළත් "වෙනත්" කෘෂිකාර්මික අංශය 1990 දී අත් කරගත් සියයට 7.8 ක සිත් ඇද ගන්නා සුළු වර්ධනය 1991 වසර තුළදී ද පවත්වා ගැනීමට සමත් විය. මෙම කෘෂිකාර්මික කටයුතු අතුරින් ආර්ථික බෝග (දුම්කොළ, උක්) සහ කුකුල් හා සත්ව පාලන යන අංශයන්හි ප්‍රගතිය වඩා කැපී පෙනුණි. මේ අතර, ඇස්තමේන්තු අනුව සුළු ආහාර, බෝගයන්හි නිමැවුම් පරිමාව, 1991 වසරේදී සියයට 4 කින් වර්ධනය වී ඇත.

1990 දී සියයට 5 ක අඩුවීමක් පෙන්නුම් කළ ධීවර උප අංශය, විවරණයට ලක් වූ වර්ෂය තුළ සියයට 12 ක වර්ධනයක් වාර්තා කෙරිණ. 1991 වසරේ ධීවර කටයුතු වඩා පුළුල් වීමට ප්‍රධාන සාධකය වූයේ නැගෙනහිර මුහුදුබඩ තීරයේ දියඹ ධීවර කටයුතු සඳහා පනවා තිබූ බාධක ලිහිල් කිරීමය.

1991 වසරේදී පතල් හා කැනීම් අංශයෙහි වූ එකතු අගයේ මූර්ත වටිනාකමෙහි ඇස්තමේන්තු ගත පහත වැටීම සියයට 10 කි. වි.ගැ.හි. මිලියන 54 ක් වූ 1990 වසරේ මැණික් අපනයන ආදායම 1991 වසරේදී වි.ගැ.හි. මිලියන 42 දක්වා පහත වැටීම, එම වසර තුළ මැණික් පතල් කටයුතු මන්දගාමී වී ඇති බවට දර්ශකයකි. ඉල්මනයිට්, රූටයිල් ඇතුළු අනෙකුත් ඛණිජ වැලි පතල්වල කැනීම් කටයුතු කෙරෙහි තවදුරටත් උතුරු ප්‍රදේශයේ පවතින සිවිල් අරගලයත් අහිතකර ලෙස බලපෑවේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1990 දී සියයට 26 කින් පහත වැටුණු ඛණිජවැලි නිමැවුම් පරිමාව 1991 වසරේදී තවත් සියයට 2 කින් පහත වැටුණි.

1986 පටන් යහපත් වර්ධන ක්‍රියාකාරීත්වයක් විදහා දැක් වූ නිමැවුම් කර්මාන්ත අංශය 1991 වසරේදීද සියයට 6.9 කින් අඛණ්ඩව වර්ධනය වී ඇත. නිමැවුම් කර්මාන්ත අංශයේ ප්‍රධාන උප අංශය වන නිෂ්පාදන කර්මාන්ත අංශයේ එකතු කළ අගය 1991 වසර තුළ සියයට 9.5 ක මූර්ත වර්ධනයක් වාර්තා කොට ඇත. එකතුකළ අගයෙහි විශාල මූර්ත වර්ධනයක් පෙන්නුම් කළ කාර්මික අංශයන් අතර, මූලික ලෝහ නිෂ්පාදන (සියයට 34) රෙදිපිළි හා ඇඟලුම් (සියයට 16) කඩදසි හා කඩදාසි නිෂ්පාදිත (සියයට 15) සහ සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 14) යන අංශ ප්‍රධාන වේ. තේ, රබර් හා පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත සැකසුම් අංශයන්හි එකතු කළ අගය 1990 වාර්තා කළ සියයට 8.4 ක් වූ වර්ධනයට ප්‍රතිවිරුද්ධ ලෙස 1991 දී සියයට 5.7 කින් පහත වැටුණි. කෘෂි සැකසුම් අංශයෙහි මෙම පසුබැස්ම සහ පෞද්ගලීකරණය කිරීමට පෙර සංක්‍රමණික අදියරක පසු වෙමින් සිටි රාජ්‍ය අංශයේ කර්මාන්තයන්හි පහත් නිෂ්පාදන මට්ටම ද, 1990 වසර හා සැසඳීමේ දී 1991 වසරේ නිමැවුම් කර්මාන්ත අංශයේ පහත් වර්ධන තත්ත්වයට දායක වූ ප්‍රධාන සාධකයන්ය.

## 1.6 සංඛ්‍යා සටහන

### ස්ථාවර (1982) සාධක වියදම් මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය 1989 - 1991

| අංශ | වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | ද. ජා. නි. හි. ප්‍රතිශතයක් වශයෙන් | | | පසුගිය වසරට වඩා වැඩිවීම (රුපියල් දශ ලක්ෂ) | | ද. ජා. නි වැඩිවීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1989* | 1990* | 1991* | 1989 | 1990 | 1991 | 1990 | 1991 | 1990 | 1991 |
| 1. කෘෂිකර්මය, දැව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය | 27,666 | 30,011 | 30,869 | 23.3 | 23.7 | 23.3 | 2,345 | 858 | 31.1 | 14.3 |
| 1.1 කෘෂිකර්මය | 23,311 | 25,729 | 26,240 | 19.6 | 20.4 | 19.8 | 2,418 | 511 | 32.0 | 8.5 |
| 1.1.1. තේ | 2,668 | 3,004 | 3,100 | 2.2 | 2.4 | 2.3 | 336 | 96 | 4.4 | 1.6 |
| 1.1.2. රබර් | 697 | 718 | 655 | 0.6 | 0.6 | 0.5 | 21 | -63 | 0.3 | -1.1 |
| 1.1.3. පොල් | 3,210 | 3,261 | 2,827 | 2.7 | 2.6 | 2.1 | 51 | -434 | 0.7 | -7.2 |
| 1.1.4. වී | 5,258 | 6,378 | 6,301 | 4.4 | 5.0 | 4.8 | 1,120 | -77 | 14.8 | -1.3 |
| 1.1.5. අනෙකුත් | 11,478 | 12,368 | 13,357 | 9.7 | 9.8 | 10.1 | 890 | 989 | 11.8 | 16.5 |
| 1.2. දැව ආදී වන ද්‍රව්‍ය | 1,985 | 2,030 | 2,107 | 1.7 | 1.6 | 1.6 | 45 | 77 | 0.6 | 1.3 |
| 1.3. ධීවර | 2,370 | 2,252 | 2,522 | 2.0 | 1.8 | 1.9 | -118 | 270 | -1.6 | 4.5 |
| 2. පතල් හා කැනීම් කටයුතු | 3,576 | 3,901 | 3,511 | 3.0 | 3.1 | 2.7 | 325 | -390 | 4.3 | -6.5 |
| 3. නිමැවුම් කර්මාන්ත | 20,488 | 22,427 | 23,979 | 17.2 | 17.7 | 18.1 | 1,939 | 1,552 | 25.7 | 25.9 |
| 3.1. අපනයන සැකසීම | 3,257 | 3,530 | 3,328 | 2.7 | 2.8 | 2.5 | 273 | -202 | 3.6 | -3.4 |
| 3.2. නිෂ්පාදන කර්මාන්ත | 15,500 | 17,085 | 18,708 | 13.0 | 13.5 | 14.1 | 1,585 | 1,623 | 21.0 | 27.1 |
| 3.3. කුඩා සහ අනෙකුත් කර්මාන්ත | 935 | 968 | 1,065 | 0.8 | 0.8 | 0.8 | 33 | 97 | 0.4 | 1.6 |
| 3.4 අනෙකුත් | 796 | 844 | 878 | 0.7 | 0.7 | 0.7 | 48 | 34 | 0.6 | 0.6 |
| 4. කැනීම් | 8,514 | 8,761 | 8,963 | 7.2 | 6.9 | 6.8 | 247 | 202 | 3.3 | 3.4 |
| 5. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා | 1,526 | 1,681 | 1,812 | 1.3 | 1.3 | 1.4 | 155 | 131 | 2.1 | 2.2 |
| 6. ප්‍රවාහනය, ගබඩා කිරීම සහ පණිවුඩ හුවමාරුව | 13,883 | 14,410 | 15,260 | 11.7 | 11.4 | 11.5 | 527 | 850 | 7.0 | 14.2 |
| 7. තොග සහ සිල්ලර වෙළෙඳාම | 25,588 | 26,497 | 28,423 | 21.5 | 21.0 | 21.5 | 909 | 1,926 | 12.0 | 32.1 |
| 8. බැංකු, රක්ෂණය සහ නිශ්චල දේපල | 6,168 | 6,556 | 6,989 | 5.2 | 5.2 | 5.3 | 388 | 433 | 5.1 | 7.2 |
| 9. නිවාස අයිතිය | 3,650 | 3,705 | 3,760 | 3.1 | 2.9 | 2.8 | 55 | 55 | 0.7 | 0.9 |
| 10. රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක කටයුතු | 6,140 | 6,355 | 6,469 | 5.2 | 5.0 | 4.9 | 215 | 114 | 2.8 | 1.9 |
| 11. සේවා (අන් තැනක සඳහන් නොවන) | 4,530 | 4,940 | 5,354 | 3.8 | 3.9 | 4.0 | 410 | 414 | 5.4 | 6.9 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය | 121,729 | 129,244 | 135,389 | 102.4 | 102.2 | 102.2 | 7,515 | 6,145 | 99.5 | 102.4 |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදායම | -2,855 | -2,818 | -2,964 | -2.4 | -2.2 | -2.2 | 37 | -146 | 0.5 | -2.4 |
| 14. දළ ජාතික නිෂ්පාදිතය | 118,874 | 126,426 | 132,425 | 100.0 | 100.0 | 100.0 | 7,552 | 5,999 | 100.0 | 100.0 |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

* තාවකාලිකයි

අසංවිධිත අංශයේ ආදායම් උත්පාදන රැකියා වැඩි කිරීම උදෙසා ලබා දුන් ආයතනික සහාය හේතුවෙන්, සුළු පරිමාණ කාර්මික ඒකකයන්හි වූ ප්‍රසාරණය විදහා දක්වමින්, 1991 දී සුළු කර්මාන්ත උප අංශය සියයට 10 ක වර්ධනයක් වාර්තා කරනු ලැබ ඇත.

ඉදිකිරීම් අංශය ඉකුත් වර්ෂයට වඩා සියයට 2.3 ක මූර්ත වර්ධනයක් පවත්වාගෙන යාමට සමත් වී ඇත. රාජ්‍ය ආයෝජන වැඩපිළිවෙලෙහි තවදුරටත් කළ කපා හැරීම් හේතුවෙන් රාජ්‍ය අංශයේ ඉදිකිරීම් කටයුතුවල වූ වර්ධනය ආන්තික වුවද, ඉදිකිරීම් අංශයේ වර්ධනයට දායක වෙමින් පුද්ගලික අංශයේ වාණිජමය හා නේවාසික ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු තවදුරටත් ව්‍යාප්ත විණි.

1990 සියයට 4.3 ක් වූ වර්ධනය හා සැසඳීමේ දී සේවා අංශයේ මූර්ත වර්ධනය 1991 දී සියයට 6.1 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. 1990 සහ 1991 වසරවල පැවැති ආර්ථික ක්‍රියාකාරීත්වයේ ඉහළ වර්ධන අනුපාතය මෙම අංශයේ වර්ධනයට රුකුලක් විණි. වෙළෙඳ, ප්‍රවාහන සේවා සහ බැංකු හා මූල්‍යමය යන අංශ 1990 වසරට වඩා ඉහළ දායකත්වයක්, 1991 වසරේ දළ ජාතික නිෂ්පාදිතයේ මූර්ත වර්ධනයට ලබා දුනි. ආනයන වෙළෙඳ කටයුතු වැඩිවීමේ හේතුවෙන් වෙළෙඳ අංශය සියයට 7.3 ක මූර්ත වර්ධනයක් ලැබීය. 1990 දී සියයට 3.8 ක් වූ වර්ධනය සමග සැසඳීමේදී ප්‍රවාහන හා පණිවුඩ හුවමාරු සේවා අංශය සැළකිය යුතු ලෙස පුළුල් වී 1991 දී සියයට 5.9 ක මූර්ත වර්ධනයක් වාර්තා කළේය. පුද්ගලික අංශයේ මගී ප්‍රවාහන සේවාවලද සැළකිය යුතු ප්‍රසාරණයක් දක්නට ලැබුණි. සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ණය යෝජනා ක්‍රමය යටතේ බස් රථ මිළදී ගැනීම සඳහා සහනදායී පොළී අනුපාතයකට පිරිනමන ලද ණය පහසුකම්හි වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෘෂිකාර්මික හා කර්මාන්ත අංශයේ නිමැවුම් පරිමාව වැඩි වීම මෙන්ම ඉදිකිරීම් කටයුතුවල වර්ධනය ද හේතු කොට භාණ්ඩ ප්‍රවාහන කටයුතු අංශය දිරිගැන්විණ. මේ අතර මෙම වසර තුළදී විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා අංශයෙහි මූර්ත වර්ධනය සියයට 7.8 ක් විණි. බැංකු හා මූල්‍යමය සේවා අංශය ද සියයට 6.6 ක මූර්ත වර්ධනයක් වාර්තා කරනු ලැබිණි. මෙය 1990 වර්ධනයට වඩා සුළු වශයෙන් වැඩිවීමකි.

රටේ ආරක්ෂක තත්ත්වය වැඩි දියුණු වීමත් සමගම 1990 පටන් යථා තත්ත්වයට පත්වෙමින් තිබූ සංචාරක ව්‍යාපාරය 1991 වසර තුළදී තවදුරටත් වර්ධනය වෙමින්, 1980 මුල් භාගයේ පැවැති මට්ටම වෙතට ළඟා වෙමින් පැවතිණි. සංචාරකයින්ගේ පැමිණීම සියයට 7.0 කින් වැඩිවුණු අතර, මේ හේතුවෙන් සංචාරක ව්‍යාපාරයෙන් 1990 වි.ගැ.හි. මිලියන 88 ක් වූ විදේශ විනිමය ඉපැයීම් 1991 දී වි.ගැ.හි. මිලියන 110 ක් දක්වා සියයට 25 කින් වැඩි කර ගත හැකි විණි. එහි ප්‍රතිඵලයක් ලෙස අනෙකුත් සේවා අංශයෙහි වර්ධනයට සැලකිය යුතු දායකත්වයක් සපයමින් 1991 දී හෝටල් සේවාවන් මගින් දළ ජාතික නිෂ්පාදිතයට එකතු කළ අගය මූර්ත වශයෙන් සියයට 14.0 කින් වැඩි වී ඇත.

## වියදම

පවත්නා වෙළෙඳ මිළ අනුව දළ දේශීය වියදම 1991 වසර සඳහා රුපියල් බිලියන 414 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇති අතර, මෙය ඉකුත් වසරට වඩා සියයට 19.2 ක වැඩිවීමකි. 1991 වසරේදී රුපියල් බිලියන 327 ක් දක්වා වැඩි වී ඇති පරිභෝජන වියදම, 1990 වසරට වඩා සියයට 18.7 ක වැඩිවීමක් වාර්තා කරනු ලැබිණි. ඒ අතරම දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 1991 වසරේදී ඉකුත් වසරට වඩා සියයට 20.9 කින් වැඩි වී ඇති අතර එය රුපියල් බිලියන 86 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත.

1991 දී පුද්ගලික පරිභෝජන වියදම 1990 දී වූ රුපියල් බිලියන 244 සිට රුපියල් බිලියන 289 දක්වා වැඩිවී ඇත. මෙය සියයට 18.5 ක නාමික වැඩිවීමකි. 1990 දී සියයට 27.2 ක වැඩිවීමක් වාර්තා කළ ආනයනික භාණ්ඩ හා සේවාවන් මත වූ පුද්ගලික පරිභෝජන වියදම ද 1991 දී සැලකිය යුතු වැඩිවීමක් (සියයට 36 ක) පෙන්නුම් කළේය. වඩාත් සැලකිය යුතු ලෙස වියදම් වැඩිවීමක් පෙන්නුම් කෙරෙනුයේ දිගුකාලීන පාරිභෝගික භාණ්ඩ අංශයෙහි වන අතර ආනයනික ආහාර හා පාන වර්ගයන් සඳහා වන වියදම සාමාන්‍ය මට්ටමක පැවතුනි. පසුගිය වසර තුන තුළ නිරීක්ෂණය කළ උපනතියට වෙනස්ව, මෝටර් රථ හා යතුරු පැදි සඳහා වූ පුද්ගලික අංශයේ වියදම්වල සැලකිය යුතු පහත වැටීමක් දක්නට ලැබුණි.

1990 වසර හා සංසන්දනයේදී රාජ්‍ය පරිභෝජන වියදම් සියයට 20.4 කින් වැඩි වී ඇත. මේ වැඩි වීම ප්‍රධාන වශයෙන් ආරක්ෂක කටයුතු සඳහා දරන්නට වූ අතිරේක වියදම් ද රාජ්‍ය අංශයෙහි ප්‍රතිව්‍යුහකරණ වැඩපිළිවෙල සඳහා වූ වියදම් ද හේතුවෙන් වූවකි.

පවත්නා මිළ අනුව දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය තොග වෙනස්වීම් ද ඇතුළුව 1991 දී රුපියල් බිලියන 86 ක් ලෙසට ඇස්තමේන්තු කොට ඇත. මෙය ඉකුත් වසරට වඩා සියයට 20.9 ක වැඩිවීමකි. 1990 දී මෙම වර්ධනය සියයට 30.6 ක් ලෙස වාර්තා වුණි. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය පවත්නා මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් ගත් විට 1990 දී සියයට 22.2 ක්ව තිබී, 1991 වසරේදී සියයට 23 ක් දක්වා වැඩි වී ඇත. මෙය ව්‍යාපාරික විශ්වාසනීයත්වය නැවත ස්ථාපිත වීමද, ආයෝජන වාතාවරණයෙහි වැඩි දියුණු වීමද විදහා දක්වයි.

1991 පවත්වා වෙළෙඳ මිළ අනුව දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය රුපියල් බිලියන 85 කි. 1990 දී මෙය රුපියල් බිලියන 70 ක් විය. 1991 වසරේදී පුද්ගලික අංශයේ ආයෝජනය සියයට 21.7 කින් වර්ධනය වූ අතර, රාජ්‍ය අංශයේ ආයෝජනය වැඩි වූයේ සියයට 19.5 කිනි. පුද්ගලික අංශයේ ආයෝජනය, කර්මාන්ත, ඉදිකිරීම් හා ප්‍රවාහන සේවා යන ප්‍රධාන අංශයන් තුළ සංකේන්ද්‍ර විය. 1991 දී වූ රාජ්‍ය ආයෝජනයන්ගෙන් විශාල කොටසක් විදුලිබල උත්පාදනය හා බෙදා හැරීම, මාර්ග සංවර්ධනය, වාරිමාර්ග, ජල සැපයුම හා පණිවුඩ හුවමාරු යන ආර්ථික පොදු කාර්ය පහසුකම් සංවර්ධනය සහ නඩත්තුව පිණිස යෙදවින. විදේශීය ආයෝජන සඳහා ලබා දුන් දිරිගැන්වීම් වලට යහපත් ප්‍රතිචාරයක් වශයෙන් සිදු වූ විදේශීය සෘජු ආයෝජනයන්හි වූ සැලකිය යුතු ප්‍රගතිය ද 1991 වසරේ ආයෝජන අංශයෙහි දක්නට ලැබුණු දිරිගන්වන සුළු වර්ධනයක් විය.

දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ ආනයන සංයුතිය, 1990 හා සැසඳීමේදී සුළු වැඩිවීමක් පෙන්නුම් කළ අතර මූලික වශයෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණවල ඉහළ ආනයන මට්ටම මේ සඳහා හේතු වුණි.

**සම්පත් පැවැත්ම හා උපයෝජනය**

1991 වසරේදී ආර්ථිකය සතු වූ මුළු සම්පත් ප්‍රමාණය රුපියල් බිලියන 520 ක් විය. 1990 දී එය රුපියල් බිලියන 444 කි. මුළු සම්පත් ප්‍රමාණයේ වැඩිවීම, රුපියල් බිලියන 54 ක් වූ දළ ජාතික නිෂ්පාදිතයේ වැඩිවීමෙන්ද, රුපියල් බිලියන 22 ක් වූ භාණ්ඩ හා සාධක නොවන සේවාවන්හි ආනයනයන්ගේ වැඩිවීමෙන්ද යුක්ත විය. මුළු සම්පත් ප්‍රමාණයෙන් සියයට 63 ක් පරිභෝජනයට ද, සියයට 17 ක් ප්‍රාග්ධන සම්පාදනයට ද වැය වූ අතර භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයනයන්ගෙන් සියයට 20 ක් අවශෝෂණය වී තිබුණි.

## 1.7 සංඛ්‍යා සටහන
## සම්පත් සංයුතිය හා උපයෝගී කරගත් ආකාරය 1982 - 1991

| ශීර්ෂය | පවත්නා වෙළෙඳ මිළ අනුව (රු. දශ ලක්ෂ) | | | | 1982 මිළ අනුව | | | | | | | | ප්‍රතිශතක වර්ධනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 1982 | | 1989* | | 1990* | | 1991* | | | |
| | 1982 | 1989 | 1990* | 1991* | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | 1989ට වඩා 1990 | 1990ට වඩා 1991 |
| 1. මුළු සම්පත් | 145,143 | 344,478 | 444,212 | 520,040 | 145,143 | 100 | 182,062 | 100 | 188,895 | 100 | 200,730 | 100 | 3.8 | 6.3 |
| 1.1. වෙළඳ මිළ අනුව ද.දේ.නි. | 99,238 | 251,891 | 321,751 | 375,339 | 99,238 | 68 | 127,735 | 70 | 135,655 | 72 | 142,166 | 71 | 6.2 | 4.8 |
| 1.2. භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන | 45,905 | 92,587 | 122,461 | 144,701 | 45,905 | 32 | 54,327 | 30 | 53,240 | 28 | 58,564 | 29 | -2.0 | 10.0 |
| 2. උපයෝගීකරණය | 145,143 | 344,478 | 444,212 | 520,040 | 145,143 | 100 | 182,062 | 100 | 188,895 | 100 | 200,730 | 100 | 3.8 | 6.3 |
| 2.1. පරිභෝජනය | 87,468 | 221,090 | 275,640 | 327,278 | 87,468 | 60 | 114,001 | 63 | 116,419 | 62 | 122,445 | 61 | 2.1 | 5.2 |
| 2.2. ස්ථාවර දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 30,279 | 54,249 | 70,417 | 85,426 | 30,279 | 21 | 31,408 | 17 | 31,879 | 17 | 36,006 | 18 | 1.5 | 12.9 |
| 2.2.1. රජය | (4,866) | (14,306) | (13,480) | (16,797) | (4,866) | (3) | (6,910) | (4) | (5,597) | (3) | (6,020) | 3 | -19.0 | 7.5 |
| 2.2.2. රජයේ සංස්ථා සහ සංයුක්ත මණ්ඩල } 2.2.3. පෞද්ගලික අංශය } | (25,413) | (39,943) | (56,937) | (68,626) | (25,413) | (18) | (24,498) | (13) | (26,280) | (14) | (29,986) | 15 | 7.3 | 14.1 |
| 2.3. තොග වෙනස් වීම් | 248 | 473 | 1,038 | 950 | 248 | - | 196 | - | 240 | - | 227 | - | - | - |
| 2.4. භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන | 27,148 | 68,666 | 97,117 | 106,386 | 27,148 | 19 | 36,457 | 20 | 40,357 | 21 | 42,052 | 21 | 11.1 | 4.2 |

* තාවකාලිකයි

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1982 ස්ථාවර සාධක මිලට අනුව වට්ටාකම ගණනය කරන ලද මුළු සම්පත් ප්‍රමාණය 1991 වසරේදී සියයට 6.3 කින් වර්ධනය වූ අතර, 1990 දී වූ වර්ධනය සියයට 3.8 කි. මූර්ත වශයෙන් ගත් කළ පෞද්ගලික පරිභෝජන වියදම 1991 දී සියයට 4.9 කින් වැඩි වී ඇති අතර එම වැඩිවීම 1990 දී සියයට 2.7 ක් විය. මේ අතර වසර තුළ රාජ්‍ය පරිභෝජන වියදම සියයට 7.3 ක මූර්ත වර්ධනයක් වාර්තා කළේය.

මූර්ත දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය 1991 දී සියයට 12.9 ක සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරනු ලැබිණි. 1990 දී මෙම වර්ධනය සියයට 1.5 ක් විය. ඉදිකිරීම් කටයුතුවල පුළුල්වීමද, යන්ත්‍රෝපකරණ හා ප්‍රවාහන උපකරණයන් උදෙසා වූ ආයෝජනයන්හි වැඩිවීමද, ප්‍රාග්ධන සම්පාදනයේ වර්ධනයට හේතු විය. පෞද්ගලික අංශයේ මූලිකත්වය සහ ප්‍රාග්ධන භාණ්ඩයන්හි මිළ ගණන්වල යහපත් චලනයන් ද මෙම වසර තුළ ආයෝජනයන්හි මූර්ත වර්ධනය සඳහා දායක විය.

තේ, රබර් හා පොල් අපනයනයන්ගේ වූ පහත වැටීම් මධ්‍යයේ වුවද, 1991 අපනයනයන් මූර්ත වශයෙන් සියයට 4.2 කින් වැඩි විය. සුළු කෘෂිකාර්මික අපනයනයන් සහ කාර්මික අපනයනයන් මෙම වර්ධනයට විශාල වශයෙන් දායක වුණි.

1990 දී රුපියල් බිලියන 46 ක් වූ දේශීය ඉතුරුම්. 1991 දී රුපියල් බිලියන 48 ක් දක්වා වැඩි වූ අතර මෙය සියයට 4.2 ක වර්ධනයකි. කෙසේ වුවද, දේශීය ඉතුරුම්, වෙළෙඳ මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතයට දක්වන අනුපාතය 1990 දී සියයට 14.3 ක්ව තිබී 1991 දී සියයට 12.8 දක්වා පහත වැටුණි. විදේශීය ශුද්ධ සාධක ආදායම සහ පෞද්ගලික ප්‍රේෂණයන් දඇතුළත් ජාතික ඉතුරුම් 1991 වසරේදී සියයට 5.8 කින් වැඩි විය.

### 1.8 සංඛ්‍යා සටහන

### ජාතික ඉතුරුම් 1989 - 1991 (පවත්නා වෙළෙඳ මිළ අනුව)

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1989* | 1990* | 1991* |
|---|---|---|---|
| 1. වෙළෙඳ මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතය | 251,891 | 321,751 | 375,339 |
| 2. දේශීය ඉතුරුම් | 30,801 | 46,111 | 48,061 |
| 3. විදේශීය ශුද්ධ සාධක ආදායම | -5,739 | -6,667 | -7,316 |
| 4. විදේශීය ශුද්ධ පෞද්ගලික පැවරුම් | 11,840 | 14,518 | 16,334 |
| 5. ජාතික ඉතුරුම් | 36,903 | 53,962 | 57,079 |
| 6. දේශීය ඉතුරුම් අනුපාතිකය (අංක 2 අංක 1 හි ප්‍රතිශතයක් ලෙස) | 12.2 | 14.3 | 12.8 |
| 7. ජාතික ඉතුරුම් අනුපාතිකය (අංක 5 අංක 1 හි ප්‍රතිශතයක් ලෙස) | 14.6 | 16.8 | 15.2 |

* තාවකාලිකයි

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව